ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2015 ජනවාරි 19 සඳුදා
07 වෙළුම - 12 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015

# ළමා ප්‍රදීපය

මිල රු 10/-

Lama Pradeepaya




Photos By : SAGARA LAKMAL DE MEL



## මාගේ දරුවනි !
## ප්‍රේමයේ පවතින්න...!

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# සුදුතුම් පියාගේ ආදරය ඔබට හිමි වුනා

## ආදරණීය දුවේ පුතේ...

අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ දසුනක් මේ වෙනකොට ඔබේ මතකයේ දැඩිව සනිටුහන් වී ඇති බවට කිසිම සැකයක් නැහැ. පසුගිය දින කිහිපය තුළ විද්‍යුත් මාධ්‍ය වල, මුද්‍රිත මාධ්‍ය වල අති උත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ රුව දිස් වීමත් ඊටත් වඩා ජුසේ වාස් මුනිඳුන් සාන්තුවරයට එසවීමේ දිව්‍ය යාගය පැවැත්වූ ගාලු මුව දොර පිටියට පැමිණ ඔබේම දෙනෙතින් එතුමාණන්ව දැක බලා ගැනීමත් නිසා දැන් නම් ඔබට එතුමාගේ රුව අමතක වන්නට කිසිම හේතුවක් නැහැ. එතුමන් මේ දිවයි-නට පා තැබූ දින පටන් හැම මොහොතකම එතුමන් ඉදිරියේ සිටියේ පුංචි ළමයින්.

එදා කටුනායක සිට කොළඹ දක්වා එතුමන්ව පිළි අරගෙන ආ ගමනේදී එතුමන්ට ආසිරි ගී ගායනා කළේත් ඔබ වගේම පුංචි දරුවන්. බුලත් අතක් දී එතුමන්ගේ දෑත් සිපාචාර කළේත්, මල්මාලා පළන්දා එතුමන්ව ආදරයෙන් පිළිගත්තෙත් ඔබ වගේම පුංචි දරුවන්. ඒ පමණක් නොවෙයි. මඟ දෙපස රැඳී සිටි ජනතාව අතරින් එතුමන් දෝතට අරන් ආදරයෙන් සිප වැළඳ ගත්තෙත් පුංචි දරුවන්වයි. අත් වල කොඩි රැඳවාගෙන ''සුදුතුම් පියේ අපි ඔබට ආදරෙයි'' කියලා සුදෝවන් ඇඳුමෙන් සැරසිලා පුංචි දරුවන් ආගමික හැඟීමකින් ඔල්වරසන් හඬ දෙනකොට සුදුතුම් පියාණන්ගේ මුහුණ සිනාවෙන් සැරසුනේ එතුමාණෝ ඔබට සැබවින්ම ආදරය කරන නිසයි.

ආදර දුවේ පුතේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා හැටියට අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියා ගනු ලබන්නේ ඒ ධුරාවලියේ 266 වන තැනයි. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය ප්‍රචලිත කරන්නට හා ඔවුන්වහන්සේගේ ආදරයේ බල මහිමය ලොවට ප්‍රකාශ කරන්නට එදා ඒ අග්‍ර ශ්‍රාවකයින් ගත් උත්සහයේ ප්‍රතිඵලය තමයි, ශුද්ධවූ කතෝලික සභාව ස්ථාපිත වීම. ශ්‍රාවකයන්ගේ දූත මෙහෙවරට නායකත්වය ලබා දුන් සා. පේදුරු තුමන් අනුගාමිකව ඉතිහාසයේ සියළුම පාප් වහන්සේලා ලෝක ජනතාවට බෙදා දුන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ වචනයේ ආදරයයි. ආදරයේ වචනයයි. ඒ කැපවීම නිසා අද විශ්ව සභාවක් සේ කතෝලික සසුන ලොව පුරා ව්‍යාප්තයි. වර්තමානයේදීත් පූජක ශ්‍රාවකත්වය තුළ සේවක සංකල්පය නිවැරදිව ක්‍රියාත්මක කරගන්නට නායකත්වය දෙනු ලබන්නේ කතෝලික සභාවේ දෘශ්‍යමාන එඬේරා හැටියට පාප් වහන්සේයි. ඉතින් එවන් උත්තම නායකයකුගේ දසුනක් බලන්නට ලැබීමත් වාසනාවක්. ආශිර්වාදය ලැබීමත් භාග්‍යයක්.

ආදර දුවේ, පුතේ, අප විශ්ව එඬේරාණන් වන අති උත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේ අපේ මේ පුංචි දිවයිනට පැමිණිලා හැම පුද්ගලයෙක් හටම ආදරයේ සෙනෙහසේ දැක්ම ලබා දුන්නා. අන් ආගමික අපේම සහෝදර ජනතාවගේ දෑස් ආදරයේ කඳුළු බිඳු වලින් දෝවනය කළා. ඒ පමණක් නොවෙයි මරදා මඩු සිද්ධස්ථානයට වැඩම කරලා ඒ ජනතාවගේ සන්තාප සනහා අපේ රටේ උතුරත්, දකුණත් යා කරන සැබෑ මනුෂ්‍යත්වයේ පාලමක් බවට පත්වුනා.

එතුමන්ගේ මේ මඟ පෙන්වීම තුළ පුංචි ඔබ අත්දකින්නේ අපේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදරයයි. සහෝදරත්වයයි. දැන් පාප් වහන්සේ අපේ දිවයිනට වැඩම කරලා නැවතත් පිටවී ගියේ මේ මනුෂ්‍යත්වයේ අගනා පාඩම පුංචි ඔබ තුළින් මේ දේශය තුළ විහිද හරින්නට පුංචි ඔබට විශාල ආරාධනාවක් කරමින්. දැන් ඔබට තවත් පටු විදිහට හිතන්න බැහැ. ආත්මාර්ථකාමී වෙන්න බැහැ. අන් අය නොව තමන් පමණක් ජය ගත යුතුයි යන මමත්වයේ ප්‍රතිපත්තියේ ඉන්න බැහැ. මිනිසුන්ව හෙලා දකින්න බැහැ.

අති උත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ ආරාධනාව දැන් පුංචි ඔබ සමඟයි. මේ දේශයේ ශුද්ධවූ කතෝලික සභාවේ ඉදිරි අනාගතය පුංචි ඔබයි යන ආයාචනාවෙන් අති උත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේ පිටවී ගිය මේ මොහොතේ එතුමන්ගේ ඒ ඉල්ලීම ඉටු කරන්න දැන් ඔබ සූදානම් වන්න ඕනා. පුංචි ඔබට එය අනිවාර්යයෙන්ම කළ හැකියි. සා. ජුසේ වාස් මුනිතුමන් ඔබේ දෑතින් අල්ලා ඔබට පෙර මඟ පෙන්වාවි. ගමන් කරන්න, සුදු දුවේ, සුදු පුතේ, ඒ ඔබට විවෘතව ඇති මාවත දිගේ.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# කොළඹ ගාලුමුවදොර පිටියේදී භාග්‍යවත් ජුසේවාස් මුනිතුමන් ශුද්ධවරයට එසවීමේ දිව්‍ය යාගය හා පිළිවෙත 2015.01.14



'අපේ දෙවිඳුන්ගේ ගැලවීම ලොවේ සීමාන්තයෝ දකිති'
(යෙසායා 52:10)

අද දින පළමු කියවීමේ අප සවන් දුන් විශිෂ්ට අනාවැකියයි, මේ. ලෝකයේ සියළු සීමාන්තයන්ට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචිය දේශනා කරන්නැයි යෙසායා දිවැසිවයා කල් ඇතුවම ප්‍රකාශ කරයි. මේ අනාවැකිය අප හට විශේෂ අරුතක් ගෙන එන්නේ සුබාරංචියේ සුවිශිෂ්ට ධර්ම ප්‍රචාරකයකු වන ශු. ජුසේවාස් මුනිතුමන් ශුද්ධවරයට ඔසවනු ලැබීම අපි විසින් මේ අවස්ථාවේදී සිදුකරනු ලබන නිසාය. සභා ඉතිහාසයේ අනෙකුත් අසංඛ්‍ය ධර්ම ප්‍රචාරකයින් මෙන්, සියළු ජාතීන් තම ශ්‍රාවකයන් කර ගන්නැයි (මතෙව් 28:19) උත්ථාන වූ කිතු සමිඳුන් දුන් නියෝගයට එතුමෝද ප්‍රතිචාර දැක්වූහ එතුමන්ගේ වදන්, ඊටත් වැඩියෙන් එතුමන්ගේ ජීවිත ආදර්ශය තුළින් එතුමෝ මේ දේශයේ ජනතාව විශ්වාසය කරා රැගෙන ගියහ. දෙවිඳුන්ගේ ශුද්ධ ජනතාව අතරේ අප හට උරුමයක් ලබාදෙන්නේ මේ විශ්වාසයයි. (ක්‍රියා 20:32)

ශු. ජුසේ වාස් මුනිතුමන් තුළින් අප දකින්නේ ශ්‍රී ලංකා වාසින් වෙත දෙවිඳුන් දක්වන කරුණාව හා ප්‍රේමයයි. එහෙත් ශුද්ධත්වයෙන් වැඩි වර්ධනය වනු පිණිස හා එතුමා සිය දිවිය කැප කළ සමඟි සන්ධානයේ සුබාරංචි පණිවුඩයට සාක්ෂි දරනු පිණිස සුබාරංචි ගමන් මගේ නොපසුබටව ගමන් කරන්නට අභියෝගයක්ද එතුමන් තුළින් අපි දකිමු. තමන් උපන් ගෝවා ප්‍රදේශයේ ඔරතෝරියාන නිකායට අයත් පූජක තුමකු වූ ශු. ජුසේවාස් මුනිතුමා මේ රටට සැපත් වූයේ ධර්මදූතික උද්යෝගයෙන් හා එහි ජනයා වෙත ඉමහත් ප්‍රේමයෙන් දැල්වී ගිය සිතකිනි. ආගමික තාඩන පීඩන හේතුවෙන් යාචකයකු සේ වෙස්වලාගත් එතුමා තම පූජක වත්පිළිවෙත් සිදුකළේ විශ්වාසිකයන් රහසේ මුණ ගැසෙමින් බොහෝවිට රාත්‍රි කාලයේදීය. සැමතින්ම වටකරනු ලැබ සිටි කතෝලික ජනතාවට එතුමන් දැරූ ප්‍රයත්නයන් ආධ්‍යාත්මික හා සදාචාරාත්මක සවියක්ම විය. රෝගීන්ට හා දුක්විඳින්නන්ට සේවය කිරීම එතුමනගේ විශේෂ ආශාව විය. වසූරිය වසංගතය පැතිර තිබූ සමයේ එතුමා එම රෝගීන්ට කළ උපස්ථාන ගැන මහනුවර රජතුමා කෙතරම් පැහැදුනාද කිවහොත් එතුමනට තම සේවාවන් ඉටු කිරීමට වැඩි නිදහසක් ලැබුනි. මහනුවර සිට දිවයිනේ අනෙකුත් පෙදෙස් කරා යන්නට එතුමනට හැකි විය. ධර්ම ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ම වැයවෙමින් දිවි ගෙවූ එතුමා පනස් නවවැනි වියේදී දිවියට සමුදුන්නේ තම ශුද්ධවන්ත භාවයට ගරු බුහුමන් ලබමිනි.

ශු. ජුසේ වාස් මුනිතුමා බොහෝ හේතුන් මුල් කොට තවදුරටත් අප හට ආදර්ශයක් මෙන්ම ගුරුවරයකුද වන නමුත් කරුණු තුනක් ඉස්මතු කර දක්වන්නට කැමැත්තෙමි. ප්‍රථමයෙන්ම, එතුමා ආදර්ශවත් පූජකතුමෙක් විය. ජුසේ වාස් මුනිතුමන් මෙන් දෙවිඳුන්ට හා අසල්වැසියාට සේවය කරන්නට කැප වූ බොහෝ පූජකවරුද, පැවිදිවරුන් හා පැවිදිවරියෝ අද අප අතර සිටිති. නොවරදින මාර්ගෝපදේශකයකු ලෙසින් ශු. ජුසේවාස් මුනිතුමන් වෙත හැරෙන්නැයි මම ඔබ එකිනෙකා දිරිගන්වමි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේව සැම තැනෙකම දැන ගන්නට සැලැස්වීමත්, උන්වහන්සේට ප්‍රේමකරනු ලැබීමත් පිණිස සීමාන්තයන් කරා ගමන් කරන්නේ කෙසේද යන්න එතුමෝ අප හට කියා දෙති.
එතුමා සුබාරංචියද අපගේ නායකයින් හට කීකරු වීමද දෙවිඳුන්ගේ සභාව වෙත ප්‍රේමනීය සැලකිල්ලද (ක්‍රියා

ඉතිරිය 10 පිටුවේ.....



## ඔවදනක්

# සතත අභ්‍යාසයේ වටිනාකම



හය වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ළමයින්ගේ ගායනා සහ නර්තන දක්ෂතා ඔප් නංවන්න තරඟාවලියක් පැවැත්වුණා. ප්‍රදේශයේ සෑම පාසැලකම ළමයින්ට මෙම තරඟයට ඉදිරිපත් වෙන්න පුළුවන් කම තිබුණා. මුලික වාරග ණනකට පෙනී සිටී මෙන් අනතුරුව තමයි අවසාන කණ්ඩායම තෝරා ගන්නේ. දරුවන් හොඳ මහන්සියක් ගත්තා තම තමන්ට හැකි උපරිමයෙන් තම ගායන සහ නර්තන දක්ෂතා ඉදිරිපත් කරන්න. ගායන ලොවේ ප්‍රසිද්ධ ගායක මහත්ම මහත්මීන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයකට තමයි මේ කටයුත්ත භාර වුයේ. ඒ වගේම නැටුම් තරග සඳහාත් ප්‍රවීණ නැටුම් ගුරුවරු කීප දෙනෙක් විනිශ්චය මණ්ඩලය ලෙස පෙනී සිටියා.

විනිශ්චය මණ්ඩලය පමණක් නොවේ. පැමිණ සිටි දරුවන්ගේ දෙමාපිය නෑදෑ හිත මිතුරන්ද මේ දරුවන්ගේ ප්‍රවීණතා දැක ඉමහත් සතුටට පත්වුණා. මෙම තරඟය ඉදිරිපත් කිරීමේ කටයුතු කළේ ප්‍රදේශයේ ළමුන් හොඳින් දන්නා අඳුනන, ගායනයට බොහොම සමත් ප්‍රසිද්ධ අයියා කෙනෙක්. ඉතින් ඔන්න එක තරඟ වාරෙකදි එක පුතෙක් හොඳ ලස්සනට ගායනයක් ඉදිරිපත් කළා. එයාගේ නම සමන් බව සභාව දැන ගත්තා. සමන්ට සෑහෙන ගායනා කුසලතාවක් තිබූ බව සැමටම පෙණුනා. ඔහුගේ නර්තන අංගය වූයේ ඇමරිකාවේ සිටි ''මයිකල් ජැක්සන්'' නැමැති ගායකයාගේ නැටුම් විලාශය අනුකරණය කරමින් කෙරුණු නිර්මාණයක්. අපේ රටට ආවේනික එකක් නොවුණත් එම නැටුම සභා ගැබම, විශේෂයෙන් පිරිමි ළමුන් කුල්මත් කරවන්නක් වුණා. පැමිණ සිටි එක අයියා කෙනෙක් සන්තෝෂය වැඩි කමටද කොහෙද හයියෙන් විසිල් එකකුත් පිම්බා.

විනිශ්චය මණ්ඩලයේ සිටි තරුණ මහතෙක් එම නැටුම හරියට අගේ කළා. ඒ වගේම ඔහු සමන්ට කියා දුන්නා නැටුම නම් ලස්සන වුණාට ඔහු දිගටම බිමම බලමින් කළ අංග චලනයන්ට වඩා සැරෙන් සැරේ ප්‍රේක්ෂකයින් දිහාත් බැලුව නම් තමයි හරි හොඳ කියා. එය වැරැද්දක් විදියට නෙමේ සමන්ට කීවේ. ඔහුටත් අනෙකුත් තරඟවලට සහභාගි වන සෑම දරුවෙකුටත් ගුරුහරු කමක් වශයෙනුයි එලෙස සඳහන් කළේ. සමන් බොහොම සතුටින් ඒ අවවාදය පිළි ගත්තා. සමන් හිතාගත්තා ඔහු එම වැරැද්ද හදා ගන්නා බව.

සමන් පුතාට පස්සේ තවත් දියණියක් ලස්සන ගැයුමක් සහ නර්තනයක් ඉදිරිපත් කළා. නර්තන තරඟයට සහභාගී වන විශේෂ විනිශ්චයකාර මහත්මියක් මේ දැරිය ගෙන් ඇහුවා දුගෙ නම මොකක්ද කියලා. ඇය කීවා ''නිමාලි'' කියලා. ඉතිං එතුමිය ඇසුවා, නිමාලි දුට කවුද මේ නැටුම ඉගැන්වුයේ කියලා. ඉතින් නිමාලි කීවා ඇය තනිවම තමයි පුරුදු පුහුණු වුයේ කියලා. විනිශ්චය මණ්ඩළයේ සිටි සැම දෙනැම නිමාලි ගේ ප්‍රකාශය අසා හොඳට පැහැදුණා. නමුත් ගුරුහරුකමක් වශයෙන් ඇයට පහදා දුන්නා, අපි කොතරම් හොඳින් දෙයක් ඉදිරිපත්කළත් අප ඒ විෂයට අදාල ගුරුතුමෙකුගෙන් හරි ගුරුහරුකම් ලබා ගත්තොත් මීටත් වඩා හොඳින් තම නර්තනයන් ඉදිරිපත් කරන්න පුළුවන් වෙන බව.



ක්‍රීඩා විල්ලවරායන්

ඉතිරිය 06 පිටුවේ



මාසික සිතිවිල්ල

**''ජනවාරි මාසය''**

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



## පළමු වරට දිව බොදුන් ලැබීම

දංකොටුව උත්ථානවූ කිතු සමිඳුන්ගේ දෙව් මැදුරට අයත් දරුවන් හයදෙනෙකුට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දනය කිරීම ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් මීසම් සහායක ගරු නුවන් එමල්ක පියතුමන්ලා අතින් පසු ගියදා සිදුවිය. අනතුරුව එම දරුවන් ගරු පියතුමන්ලා දහම් පාසල භාරව කටයුතු කරන ගරු ගර්ට්රූඩ් පැවිදි සොයුරිය සහ දහම් ගුරු උපදේශිකා අවින්ද්‍යා ශෙහානි ප්‍රනාන්දු මෙනවිය සමග ඡායාරූපයකට පෙනීසිටි අයුරු.

**සේයා :- ශ්‍රේෂන් / සටහන :- ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

## ලක්දිව සුදුවරයාණෝ



ජුසේවාස් පියතුමෝ
ඉන්දියාවෙ ඉපදුනෝ
ලංකාවට ආවෝ
කිතු දහමත් ගෙනාවෝ

ලන්දේසී අභියෝග ගෙන
බිඳකුදු බිය නොව ගෙන
දෙවිඳුන් අත අල්ලා ගෙන
පිය නැගුවේ වෙස්වලා ගෙන

පාමින් නොයෙකුත් පෙළහර
අප විශ්වාසය තරකර
අලි ඇතුන් පන්නාහැර
දිනුවේ ලක් සසුන්ඹර

රාත්‍රියේ හොර රහසින්
ජේසුව බෙදමින් මිනිසුන්
ළං කරමින් මුළු හදින්
දුන්නේ ප්‍රසාද නිධානයන්

වෙලාගත් කළ වසූරිය වසංගත
පෙන්වුයේ ජේසුගේ දයා හදවත
වෙනස්වුයේ රජුගෙ ගල් හිත
බෙදුවේ ඒ දේව පෙම් සිත

තරුණ දිවයේදීම ජීවනය පුදකරමින
නිවීයමින් තිබුණු දහම් පහන දල්වමින
ගෙනගියේ ජේසුගෙ සිත නොරිදවමින
පණ පිදුවේ උතුම් ආදර්ශය දෙමින

**ඩේමියන් දෙව්මිණ**
**04 ශ්‍රේණිය**
ශා. බර්නදෙත් ආදර්ශ මහා විද්‍යාලය - පොල්ගහවෙල



**ආදර සුදුතුම් පියතුමා**

**රොෂෙල් ඇන්ජලෝ පෙරේරා**

**11 ශ්‍රේණිය**

**සා. දොන් බොස්කෝ දෙව්සත්හල කටුකෙන්ද**



**භාග්‍යවත් ජුසේවාස් මුනිතුමා**

**ට්‍රෙවෝන් ශෙනන් රිංස්ලි**
**08 ශ්‍රේණිය**

**ශා. පාවුළු දහම් පාසල නොළුම්පිටිය (දළුපත මීසම)**

04 පිටුවෙන්.......

## සතත අභ්‍යාසයේ වටිනාකම

ඉතින් ගුරුහරුකමක් වශයෙන් ඇයටත් අනෙකුත් තරඟයට සහභාගී වන දරුවන්ටත් දැක ගැනීම සඳහා එතුමිය වේදිකාව මතට පැමිණ නිමාලි නැටු නැටුමටම සමානව අදාල ගායනයට අනුව නටා පෙන්නුවා. එතුමිය පාද හසුරවමින් සහ දෙඅත් ලාලිත්‍යමය විලසින් හසුරුවමින් නියම ලෙස අංග චලන කළ යුතු විලාශය දරුවන්ට පැහැදිලි කරමින් අපූරු නර්තනයක් ඉදිරිපත් කර පෙන්වුවා. එතුමියගේ නැටුම තුළින් නිමාලි දුවට පමණක් නොවෙයි, මුලු ප්‍රේක්ෂාගාරයම ඉමහත් ප්‍රබෝධයකට පත් කරවන්නට හැකි වුණා. සියලු දෙනාම ලොකු අත්පොළසන් නාදයකින් ඔවුන්ගේ සතුට පළ කළා.

තරඟයේ අන්තිමයාට පෙනී සිටියේ  අටවැනි ශ්‍රේණියේ ඉගෙන ගන්නා රමණී දැරියයි. වේදිකාව මතට එන විට ඇයගේ මුහුණේ දිස්වුයේ බයක් චකිතයක් නොව හරිම පිරුනු සිනහවකින් පිරි උද්‍යෝගයක්. ඇයගෙන් ඇසු සෑම ප්‍රශ්නයකටම ඇය උත්තර දුන්නේ හරිම සිත්ගන්නා සුලු විලාසයකිනුයි. ගායනය පටන් ගන්නත් ප්‍රථම ඇයට සභාවේ ආදරය දිනාගන්නට හැකියාව ලැබුණා. ඇය ඉතාමත් මිහිරිව ඇයගේ ගීතය ඉදිරිපත් කළා. විනිශ්චය මණ්ඩලයට අදහා ගන්නත් බැරි තරම් ඇයගේ ගායන කුසලතාවය ඉතාමත්ම විශ්ෂ්ට මට්ටමක තිබුණා. ඊළඟට තිබුණේ නැටුම්තරඟය. රමණී තමන්ගේ අත් පා විහිදුවමින් ඉතාමත්ම ලාලිත්‍යමය ස්වරූපයකින් ඇගේ නැටුම නිමා කළත් ඇයගේ නැටුම අවසාන වු විට විනිශ්චය මණ්ඩලය තම ආසනවලින් නැගී සිට අත්පොලසන් දුන්නා. ඔවුන් එසේ කරනවා දුටු ප්‍රේක්ෂකයින්ද තම අසුන් වලින් නැගිට අත්පොලසන් දුන්නා. සැමදෙනාම නැවත නිශ්ශබ්ද වු පසු එක විනිශ්චය කාර මහත්මියක් රමණී දැරියගෙන් විස්තර විමසුවා. රමණී කීවා ඇය සංගිත ගුරුතුමකුගෙන් සංගීතය හදාරන බවත්, නැටුම් ගුරතුමියකගෙන් නැටුම් හදාරණ බවත් ''ඔව් අපට ඒ බව හොඳට තේරුණා.'' කියා දෙවන විනිශ්චකාරතුමියත් කීවා. ඇය සඳහන් කළා අප සැම විටම සහජ දක්ෂතාවන් අගය කළ යුතු නමුත් ඒ දක්ෂතා, ගුරුහරුකම් තුළින් ඔප මට්ටම් කර ගත් විට සිදුවන දේ ප්‍රතිඵල අපි අද අපේ ඇස්පනාපිටම දුටු බව කියමින් නිසි ගුරුහරුකම් ලබා ගැනීමේ අගය පිළිබඳව අනෙකුත් තරඟ කරුවන්ටත් පහදා  දුන්නා.

රමණී දැරියගේ විශිෂ්ට ඉදිරිපත් කිරීම් තුළින් අනෙක් දරුවන්ටත් ඒ වාගේම පැමිණ සිටි දෙමාපියන්ටත් හොඳාකාරවම වැටහුණා. ගායනයට හෝ නර්තනයට පමණක් නොව වෙනත් ඕනෑම ආධුනික කටයුත්තකදී වුවත් ප්‍රවීණතාවය ලබන්නට නම් තමතමුන් ''සතත අභ්‍යාස'' වල නියැලීම අත්‍යාවශ්‍ය බව.

## ජේසුගේ ආදරය අත්විඳි අත්දැකීමක්

අද මම ඔබත් සමඟ බෙදා හදා ගන්න යන්නේ මගේ ජීවිතයේ ජේසුව ඉතා හොඳින් අත්දැක්ක ප්‍රබල මොහොතක් පිළිබඳව. මගේ ජීවිතයේ තිබුණ ලොකු ආශාවක් තමයි දකුණු ආසියාවේ රටවල් කීපයක දලාසාල් පාසල් පිළිබඳව අධ්‍යාපනය නිරත වීම. මේ අවස්ථාව මා පසුගිය අගෝස්තු මාසයේ උදා වුනා. මේ අනුව දකුණු ඉන්දියාව, සිංගප්පුරුව, මැලේසියාව යන රටවල පාසල් කීපයක් නරඹන්න මට අවස්ථාව ලැබුණා. කෙසේ වෙතත් මෙම ගමන සහභාගී වුනේ මම තනියම. මා සැලසම් කළ පරිදි මා මුලින්ම සංචාරය කළේ සිංගප්පුරුවේ. එහිදි සියලු දෙනා සුහදව පිළිඅරගෙන නොමිලේම සියලු පහසුකම් සපයා දීමට කාරුණික වූවා. එහෙත් මැලේසියාවේදී අදාළ ස්ථානයට ළගා වීමට එතරම් පහසු වුයේ නෑ. මෙයට හේතුව තමයි ක්වාලාම්පූර් නගරයේ සිට අමන් ජයාන් යන නගරයට යාමට පැය 3ක කාලයක් ගෙවා දැමීමට සිදුවීම. ඒ අනුව ක්වාලාම්පූර් නගරයේ සිට අමන් ජයාන් නගරයට යාමට මා ප.ව. 2.30ට පිටත් වූවා. 5.15 වන විට නියමිත පරිදි අදාළ බස් නැවතුම්පලට ළගා වීමට හැකිවුවා. එහිදි 5.30 වන විට අදාළ බස් නැවතුම්පලට මා පිළිගැනීමට පැමිණියේ හින්දු කාන්තාවක්. ඇය තම මෝටර් රථයේ නංවාගෙන, ලසාලියානු පාසලට අනුබද්ධ ආයතනයට රැගෙන ගියා. ඒ විතරක් නොවෙයි. ආහාර පාන ඇතුළු අවශ්‍ය සියල්ල සපයා දීමටත් ඈ කරුණික වූවා.

දින 4ක සංචාරයෙන් අනතුරුව නැවත අමන් ජයාන් යන බස් නැවතුම්පලට මා රැගෙන ඒමට ඉදිරිපත් වුයේ හින්දු තරුණ දරුවෙක් සහ  ඇගේ මව. කේසේ වෙතත් මේ සියලු වැඩකටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලැබුවේ දෑස් හරියටම නොපෙනෙ ලෝකයේ සැබෑ සුන්දරත්වය දැකීමට අවස්ථාව නොලද තරුණයෙක්. ඉන් අනතුරුව මා සංචාරය කළේ දකුණු ඉන්දියාවේ. දකුණු ඉන්දියාව සහ ලංකාව අතර යම් විරසක වීම් තිබුණත්, දකුණු ඉන්දියාවේ සිසු දරුවන් අතර ඉහළම ප්‍රසාදයක් දිනා ගැනීමට මා වාසනාවන්ත වූවා. අපි ගොඩක් වෙලාවට වැඩ කටයුතු කරන විට අපේ යාළුවා, අපේ ගම, අපේ ජාතිය, අපේ වර්ගය ආදී වශයෙන් පටු විදිහට කල්පනා කරලා අපි කැමති අයව පමණක් උදව් පදම් කරන්න පෙළඹෙනවා. තවත් සමහරු යම් කෙනෙකුට උදව්වක් කරන්න වෙයි කියලා හිතලා අදාළ ස්ථානයෙන් පලා යනවා. මඟ හරිනවා. නොදැක්කා සේ කල් ගෙවනවා. මා අත්දුටු මේ සිදුවීම් සියල්ලෙන් උගත හැකි පාඩම් බොහෝය. අපි කුල මල භේදයෙන් තොරව, ප්‍රේමයෙන් යුතුව දිවි ගෙවනවා නම් ලෝකයේ කොයි රටක කොයි ප්‍රදේශයක ගියත් ජේසුගේ ආදරය අත්දැකිය හැකියි.

**ජේ.ඒ. නිමාලි ප්‍රනාන්දු ගුරුමව**

දෙහිගහපිටිය මීසමේ ළමෝ 10 ක් පසුගියදා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ.

දිව්‍ය පූජා යාගය මීසම් සේවක ගරු ජූඩ් අමිල ප්‍රනාන්දු , ගරු වර්ගීස්, ගරු දිලීප් පියතුමන්ලා, පැවැත්වූ අතර ගරු පියතුමන්ලා , ගුරු මහත්මීන් ළමුන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**සෙව්වන්දි ජයවර්ධන**





මීගමුව සාන් පීතර දහම් පාසලේ වාර්ෂික තෑගි බෙදා දීමේ උළෙල පසුගියදා මීගමුව ආවේමරියා කන්‍යාරාම යේදී පැවැත්වුණි. මීසම් සේවක ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමාගේ අනුශාසකත්වයෙන් දහම් පාසලේ ගුරුමණ්ඩලය දෙමපියන් හා සිදු දරුවන් එක්ව මෙම උත්සවය සංවිධානය කෙරෙනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.



**නාත්තන්ඩිය මීසමේ නත්තල් උත්සවය සහ තෑගී ප්‍රදානෝත්සවය පසුගියදා පැවැත්වුණි. මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමන්ගේ මඟ පෙන්විම යටතේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන්වද මේ සඳහා සහභාගී කරගන්නා ලදී. හිරෝෂනි ආශා ගුරු මෑණියන්ගේ මග පෙන්වීම යටතේ ඉගනුම ලබන මෙම දූ දරුවන් ඉදිරිපත් කළ රංගනයේ අවස්ථාවක් සේයා රුවෙහි දිසිවේ.**

**ශ්‍රියාංගණී ෆිලිෂියා**

---



**දළුපත මීසමේ අභිවෘර්ධි ආලේපය ප්‍රසාද නිධානය ලැබු ළමුන් සඳහා විශේෂ දෙසුමක් පසු ගියද දළුපත සා. අන්තෝනි සිද්ධස්ථානයේ දී පැවැත්වුනි. මෙය මෙහෙයවනු ලැබුයේ ළමා ප්‍රදීපය සහය සංස් කාරක කුමර නයනජිත් මහතාය. මීසම් සේවක ගරු ජුඩ් ලක්ෂමන් පියතුමන්ගේ අදහසකට අනුව මීසම් සහයක ගරු නුවන් බුද්ධික පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ආචාර්ය මණ්ඩලයේ සහයෙන් මෙය සංවිධානය කෙරිණි.**

# පුංචි ඔබට ආදරය ක
# සිරිලක පි







කටුනායක ජාත්‍යාන්තර ගුවන්
වන දින අප මව්බිමට සැපැ
පියාණන් මහත් හරසරින් පි
පැවැත්වූ කථාවේදී සුදුතුම් පි
පැමිණෙන දිනය උදාවනතුරු ඉ
හිඳි

විවෘත රථයකින් කටුනායක
සැදැහැවත් ජනතාවට ආචා
තානාපති නිල නිවස දක්ව
මෙහිදි එතුමන්ට ලැබුණේ ඉ
වෙලා ඉර අව්රස්නය නොත
සිටියේ සමස්ත කතෝලිකයින්
බලාපොරොත්තුවෙනි. මෙහිදී
හට අවස්ථා කීපයකදී ආශිර්

ජනවාරි 14 වන දින ගාළු
මුනිතුමන්ගේ සාන්තුවරයට ඔ
සඳහා විශාල ජනකායක් එක්
රැදී කතෝලික කොඩි හා සුදු
පියාගේ ඡායාරූප ප්‍රදර්ශනය
දරුවෝ රැසක් වූහ. අපගේ ළ
සාංචාරය සඳ මතක

# රන සුදුතුම් පියතුමාගේ
# තූර කතාව

සේයා :- සාගර ලක්මාල් ද මෙල්







ි තොටුපළින් 2015 ජනවාරි 13
ත්වූ පළමුවන ප්‍රැන්සිස් සුදුතුම්
ළිගැනුනි. ගුවන් තොටුපළේදී
යා සඳහන් කළේ ශ්‍රී ලංකාවට
තා ආශාවෙන් එතුමන් මගබලා
බවයි.

සිට කොළඹ මීගමුව පාරේ
ර කරමින් කොළඹ වතිකාන
සුදුතුම් පියා ගමන් කලා.
ා ඉහල ප්‍රතිචාරයකි. බොහෝ
කමින් මඟ දෙපස ජනයා රැඳී
ග් නායක එඬේරාගේ පැමිණීම
සුදුතුම් පියාගෙන් කුඩා ළමුන්
වාදය ලැබීම විශේෂත්වයකි.

මුවදොර පිටියේ ජුසේවාස්
වොලීමේ විශේෂ දේව මෙහෙය
රොක්ව සිටියා. මෙහිදී අතෙහි
ුම් පිය කොඩි ඔසවමින් සුදුතුම්
කරමින් ප්‍රීතියෙන් රැදී සිටි කුඩා
මුන්ට සුදුතුම පියාගේ ශ්‍රී ලංකා
යේ රැඳී පවතිනු ඇත.

03 පිටුවෙන්.......

# කොළඹ ගාලුමුවදොර පිටියේදී භාග්‍යවත් ජුසේවාස් මුනිතුමන් ශුද්ධවරයට එසවීමේ දිව්‍ය යාගය හා පිළිවෙත 2015.01.14



20:28) යන කරුණු වලදී ඉවසිලිවන්ත ලෙසින් පීඩා විඳීමේ ආදර්ශයක්ද වේ. අප මෙන්ම ශු. ජුසේ වාස් මුනිතුමන්ද දිවි ගෙවූයේ සීඝ්‍ර හා ගැඹුරු පරිවර්තන යුගයකයි. කතෝලිකයින් සුළුතරයක් වූ අතර නොයෙක් විට ඔවුහු ඇතුළතින් භේදභින්න වී සිටියෝය. ඇතැම් විට පිටස්තරයෙන් එදිරිවාදිකම්ද තාඩන පීඩන පවා දක්නට ලැබුනි. එසේ වුවත් එතුමා කුරුසපත් කිතු සමිඳුන් සමඟ නිබඳව යැදුමින් බද්ධ වී සිටි හෙයින් සියළු ජනයින් හට දේව කරුණාව හා උන්වහන්සේගේ සමඟිසන්ධානයේ ප්‍රේමය පිළිබඳව ජීවමාන සලකුණක් වන්නට එතුමනට හැකි විය.

දෙවනුව, ශු, ජුසේවාස් මුනිතුමා අප හට පෙන්වා දෙන්නේ සාමය උදාකරනු සඳහා ආගමික භේදයන් දුරලීමේ වැදගත්කමයි. දෙවිඳුන් වෙත එතුමා දැක්වූ පූර්ණ ප්‍රේමය නිසා තම අසල්වැසියාට ප්‍රේමකරන්නට එතුමාට හැකියාව ලැබුණි. දුගීන්ට එතුමෝ පිහිට වූහ. ඔවුන් කවුද, ඉන්නේ කොතැනද යන්න ප්‍රශ්නයක් කරගත්තේ නැත. ශ්‍රී ලංකාවේ වත්මන් කිතු සසුනේ පිබිදීමක් ඇති වන්නට එතුමන්ගේ ආදර්ශය අඛණ්ඩව පිටිවහලක් වන්නේය.. සභා මාතාව සතුටින් හා නොමසුරුව සමාජයේ සියළු සාමාජිකයන් හට සේවය කරන්නීය. තම පාසල්, රෝහල්, සායන හා අනෙකුත් බොහෝ දයා සේවාවන් ඇසුරින් ඇය සලසන සේවාවේදී ජාතිය, ලබ්ධිය, කුලය, සමාජ තත්ත්වය හෝ ආගම ප්‍රශ්නයක් කරගන්නේ නැත. ඊට ප්‍රතිඋපකාර වශයෙන් ඇය ඉල්ලා සිටින එකම දෙය නම් මේ දූත මෙහෙවර ඉටුකිරීමේ නිදහසයි ආගමික නිදහස මූලික මානව අයිතියකි..

තනි තනිව හෝ අන්‍යයන් හා එක්ව සාමය සොයා යාමේ හා බියගැන්වීමෙන් හා බාහිර බලපෑමෙන් තොරව ඔහුගේ හෝ ඇයගේ ආගමික විශ්වාසය එළිපිටම ප්‍රකාශ කිරීමේ කටයුත්තේදී සැම පුද්ගලයකුටම නිදහස තිබිය යුතුය. ශු, ජුසේවාස් මුනිතුමන්ගේ දිවියෙන් ඉගැන්වෙන ලෙස සැබෑ දේව වන්දනාව එල දරන්නේ වෙනස්කම් කිරීම, වෛරය හා හිංසාව තුළින් නොව දිවියේ පාරිශුද්ධත්වයට ගරු කිරීම, අන්‍යයන්ගේ අභිමානයට හා නිදහසට ගරු කිරීම හා සැමගේ සුබසෙත වෙනුවෙන් ප්‍රේමයෙන් කැපවීම තුළිනි..

අවසන් වශයෙන්, ශු, ජුසේවාස් මුනිතුමා අප හට ධර්මදූතික ජ්වලිතකම පිළිබඳ ආදර්ශයක් ලබාදෙයි. එතුමා සිරිලකට සැපත් වූයේ කතෝලික සැදැහැ සංඝයට සේවය කිරීමට වුවත් එතුමන්ගේ ධර්මදානිය දයාව සියල්ලන් කරා විහිදී ගියේය, තම නිවෙස, පවුල, තමනට සුපුරුදු වටපිටාවේ සුව පහසුව පසෙකලා තමන්ට යන්නට සිදුවූ කවර හෝ ස්ථානයකට වුවද ගොස් ක්‍රිස්තුන්වහන්සේ ගැන කථා කරන්නට තමන් ලද කැඳවීමට එතුමෝ පිළිතුරු දුන්හ. ගෞරවය, කැපවීම, නොපසුබට උත්සාහය හා බැහැපත්කම ඇසුරින් බහු ආගමික පසුබිමක් තුළ සුබාරංචියේ සත්‍යතාවය හා අලංකාරය හෙළිකරන ආකාරය ගැන ශු, ජුසේවාස් මුනිතුමෝ දැන සිටියහ. ජේසුස් වහන්සේව අද අනුගමනය කරන්නන් ගත යුතු මගද මෙයමයි. ශු, ජුසේ වාස් මුනිතුමන් තුළ තිබූ ජ්වලිතකම හා ධෛර්යය ඇතිව සමාජයට පියංමකරන්නට අප කැඳවනු ලබන නමුත් එහිදී එතුමන්ගේ සංවේදිබවත්, අන්‍යයන් වෙත එතුමන් තුළ වූ ගෞරවයත්, මේ දේ ගොඩනැගීමේ හැකියාව ඇති වරප්‍රසාදයේ එම වදන (ක්‍රියා 20:32) ඔවුන් සමඟින් බෙදාගැනීමේ එතුමන්ගේ අභිලාෂයත් තිබිය යුතුය.

ධර්මදානයේ ශ්‍රාවකයන් වන්නට අපි කැඳවනු ලබමු. හිතාදර සොයුරි සොයුරියනි, ශු, ජුසේවාස් මුනිතුමන් ආදර්ශයට ගනිමින් මෙරටේ කිතුනුවන්ට විශ්වාසයේ ස්ථිරව සිටිමින් ශ්‍රී ලංකා ජන සමාජයේ සාමයට, සාධාරණත්වයට හා සමඟි සංධානයට වැඩි වැඩියෙන් දායකත්වයක් ලබාදෙන්නට හැකිවේවායි දෙවිඳුන් යදිමි. ක්‍රිස්තුන් වහන්සේ ඔබගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි, ශු, ජුසේවාස් මුනිතුමන් ඔබට කියා දෙන්නේ මෙයයි, සභාව ඔබෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ලොව පුරා සභාව එක්ව සමිඳුන්ට හට නව ගීයක් ගයන්නටත් උන්වහන්සේගේ මහිමය පොළොවේ සියළු සීමාන්තයන් කරා ප්‍රකාශ කරන්නටත් ඔබට හැකිවනු පිණිස ඔබ සැවොම අපගේ නව සුද්ධවරයාණන්ගේ යැදුම් වලට භාර කරමි. සමිඳුන් උතුම්ය. උන්වහන්සේට බොහෝ පැසසුම් හිමිවිය යුතුය.. (ගීතා 96:1-4) ආමෙන්

# මරුද මඩු ජපමාල අප ස්වාමිදු සිද්ධස්ථානයේ ශුදුතුම් පිය මරිය යැදුම

**දයාබර සහෝදර සහෝදරියනි,**



අප සිටින්නේ අප අම්මාගේ නිවහනේය. මෙන්න එතුමිය ඇයගේ නිවහනට අප පිළිගන්නීය. මඩු අප ස්වාමිදු සිද්ධස්ථානයේදී සෑම වන්දනාකරුවකුටම සිය නිවහනේ සිටින්නාක් බඳු හැඟීමක් ඇති වේ. මෙහිදී මරිය වහන්සේ අපව ස්වකීය පුත්‍රයාණන් වූ ජේසුස් ස්වාමීන් වහන්සේ තුළට රැගෙන යන්නාහ. මෙහිදී ශ්‍රී ලාංකිකයන්, දමිළ සහ සිංහලයෝ එක ලෙසින් එක පවුලක සාමාජිකයන් බවට පත්වන්නාහ. ඔවුහු දේව මාතාවන්ට ස්වකීය ආනන්දයන් සහ දුඃඛවේදනාවන් ද, තම තමන්ගේ බලාපොරොත්තු සහ අවශ්‍යතාවයන් ද පවරා දෙන්නාහ. ඕ තුමියගේ නිවහනේ දී ඔවුහු සුරක්ෂිත බව අත්දකින්නාහ. දෙවියන් වහන්සේ තමන්ට ඉතා සමීප බව දන්නා නිසාත්, උන්වහන්සේගේ ප්‍රේමය තමන් අත්දකින බව හැඟෙන නිසාත්, ඔවුහු උන්වහන්සේගේ මෘදු කරුණාව හඳුනා ගනිති.

අද මෙහි එක් රොක් වී සිටින පවුල් දීර්ඝකාලීන අර්බුදය නිසා, බරපතල දුඃඛ දොම්නසයන්ට මුහුණ පෑම නිසා ශ්‍රී ලංකාවේ හදවත ඉරා දමා විවර කරන්නට සමත් විය. උතුරේ මෙන් දකුණේ ද බොහෝ පුද්ගලයෝ එක ලෙසින් බිහිසුණු ප්‍රචණ්ඩත්වයෙන් සහ ලේ වැගිරීම් වලින් ඉකුත් වසර ගණනාවක් තිස්සේ ඝාතනයට ලක්වූහ. කිසිදු ශ්‍රී ලාංකිකයකුට මේ ස්ථානයේ දුඃඛදායක සිද්ධීන්, ඒ ඒ ස්ථාන, දින වකවානු වලදී මේ ආශ්වර්යවත් දේවමාතා ප්‍රතිමාව ශ්‍රී ලංකාවේ ඉපැරැණි කිතුනුවන් මෙහි රැගෙන විත් තුබූ නමුත් එතුමියගේ සිද්ධස්ථානයෙන් එය රැගෙන යන්නට සිදුවිය.

එහෙත් අප ස්වාමිදුව නිරන්තරයෙන් ඔබ සමඟ සිටින්නීය. ඕ තුමිය සෑම නිවහනකම, සෑම තුවාල වූ පවුලකම යළි සාමකාමී එකමුතුවීමකට බලා හිඳින සෑමට දයාබර මාතාව වන්නීය. අද දින අප එතුමියගේ රැකවරණය තුළ ශ්‍රී ලංකාවේ ජනතාව අතීතයේ හා වර්තමානයේ දී බොහෝ අනතුරු වලින් මුදා ගත් නිසා තුති පුදන්නෙමු. දේව මාතාව කිසිදිනක මේ බබළන දූපතේ ඇයගේ දරුවන් අමතක නොකළාය. එදා ස්වකීය පුත්‍රයාණන්ගේ කුරුස ගස ළඟින් එක මොහොතක්වත් ඉවත්ව නොගිය ලෙසින් ශ්‍රී ලංකාවේ වේදනා විඳින දරුවන් අමතක නොකර ඔවුන්ගේ පැත්ත ගත්තාය.

අද දින අප ස්වාමිදුවගේ ඒ මැදිහත්කම උදෙසා තුතිපිදිය යුතුය. බොහෝ දුඃඛ පීඩාවන්, ප්‍රචණ්ඩත්වයන් සහ විනාශ වීම් මධ්‍යයේ ඕතුමිය අපව නොකඩවා ජේසුස් ස්වාමීන් වහන්සේ වෙතට රැගෙන යෑම ගැනත්, උන්වහන්සේගේ බලයට පමණක් විවර වූ තුවාල සුවපත් කර, කැඩී බිඳී ගිය හදවත් වලට සාමය උදාකළ හැකිය. එහෙත් එතුමිය වෙතින් දෙවියන් වහන්සේගේ කරුණාව අපට ලබා දෙන්නට මැදිහත් වන්නැයි ඉල්ලා සිටිය යුතුය. මේ බිමේ දන්නා අපගේ පාපයන් සහ සියලු නපුර බෙදා වෙන් කරන්නට වරප්‍රසාද ඉල්ලා සිටිමු. එය සිදුකිරීම එතරම් පහසු දෙයක් නොවේ. ඊට හැකිවන්නේ කුරුසියේ ආලෝකය මැද නපුරා අප සමඟ වෙසෙමින්, අපගෙ'ම කොටස්කරුවකු වෙමින් ඇති අන්දම සැබෑ පශ්චත්තාපයෙන් සහ සිත් හැරීමෙන් අප අවබෝධ කර ගන්නේ නම් පමණි. එහිදී පමණක් එකිනෙකා තුළ සැබෑ පසුතැවිල්ල, සැබෑ කමා දානයන් පිරිනැමීමට හා ලබා ගැනීමට අපට හැකිය. මේ දුෂ්කර ව්‍යායාමයේදී කමා දානයට සහ සාමය සෙවීමට දේව මාතාව නිරන්තරයෙන් මෙහි සිට අපව දිරිගන්වමින් ද, අපට මඟ පෙන්වමින්ද, අපට නායකත්වය දෙමින්ද සිටින්නීය. ඕ තුමිය ස්වකීය පුත්‍රයාණන්ගේ මිනීමරුවන්ට කුරුසිය පාමුල දී කමාව දානය කර, උන්වහන්සේගේ ප්‍රාණය නිරුද්ධ සිරුර සිය දෑත් මත හොවා ගත්තාය. එහෙයින් දැන් ඕතුමියට ශ්‍රී ලාංකිකයන් විශිෂ්ටතම වූ සංහිඳියාවකට, දෙවියන් වහන්සේගේ කමාව සහ දයා කරුණාව නමැති ආලෝකයෙන් සියලු දෙනා හට සැබෑ සුවයක් අත්දැකීම සඳහා මඟ පෙන්වීමට අවැසි කර තිබේ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ සිංහල හා දමිළ බස කතා කරන ජන කොටස් වශයෙන් අප දේවමාතාව හා එකමුතුව එතුමියගේ මැදිහත්කමින් අපෙන් තුරන් වී ගොස් ඇති එකමුතුව යළි ගොඩනග න්නැයි යාච්ඤා කරමු. යුද්ධය නිමා වූ සැනින් දේව මාතාවන්ගේ ආශ්චර්යවත් ප්‍රතිමාව මඩු සිද්ධස්ථානය කරා නැවත රැගෙන පැමිණි අතර ශ්‍රී ලංකාවේ දූ පුතුන් ලෙස දෙවියන් වහන්සේගේ නිවහන කරා සංහිඳියාවේ සහ සහෝදරත්වයේ නැවුම්වූ ස්ප්‍රීතුවෙන් පූර්ණ වී පැමිණෙන්නැයි ඉල්ලා අපි යාච්ඤා කරමු. දයාබර සහෝදර සහෝදරියනි, ඔබ සියල්ලන් සමඟ මරිය මාතාවන්ගේ නිවහනේ සිටින්නට ලැබීම ගැන මම ප්‍රීතිවෙමි. අපි එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු. ඒ සියල්ල මැද මේ සිද්ධස්ථානය නිරන්තරයෙන් යැදුමේ ගෘහයක් සහ ස්වර්ගීය සාමයේ ස්ථානයක් වන්නැයි අපි ඉල්ලා සිටිමු. මඩු අප ස්වාමිදුවගේ මැදිහත්කමින් සංහිඳියාවේ, යුක්තියේ සහ සාමයේ ශක්තිමත් අනාගතයක් මේ ආදරණීය මවුබිමේ වෙසෙන සියලු දූ දරුවන්ට ලැබේවා! ආමෙන්



## අප ආදර මරි මවුන්

**කවීශර සිතුමිණ**

02 ශ්‍රේණිය
ශු. ෆ්‍රැන්සිස් ද සාලෙස් දහම් පාසල
දළුගම

## ශ්‍රී ශරීරය හා රුධිරය

**රවිඳු දේශාන්**

02 ශ්‍රේණිය
ශු. රෝගුස් මුනිඳුන්ගේ දහම් පාසල
(ඉරබඩගම මීසම)




# පුංචි අපේ චිත්‍ර පිටුව

## මෝස්තරයක්

**නිපුනි ප්‍රබෝධා සිල්වා**

07 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ



## ශු. මිකායල් අග්‍රදූතයාණෝ

**නිර්මාල් පෙරේරා**

06 ශ්‍රේණිය
සා. සෙබස්තියන් විදුහල - මොරටුව





## මුහුදු වෙරළේ සතුටු වන ළමුන්

**ලවනි චමත්කා**

04 ශ්‍රේණිය
නිර්මල ආරෝග්‍ය දේවමාතා දහම් පාසල
පොල්ගහඅගාර (දුනකදෙනිය මීසම)

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ ඇඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



## පරිසරයේ අසිරිය

**කවිෂ්ක චාමිකර**

08 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල
මිල්ලව

# ශු. දේව ජුවාම් මුනිතුමා



## සුදුවර චරිතයක් හඳුනාගනිමු



**අරක්ගත් මුනිවරිය : පොත් අලවිකරන්නන්ගේ රෝගීන්ගේ හා රෝහල්හී, හෙදියන්ගේ, වෛද්‍යවරුන්ගේ**

**ජීවිත කාලය : 1495 - 1550**

**මංගල්‍යය දිනය : මාර්තු 08**

**රට හෝ ග්‍රාමය : මොන්තෙමෝරෙලිනෝවෝ, පෘතුගාලය**

**හෙබ්‍රව් නාමයේ අරුත : දේව තිළිණයකි , දේව සමාව**

දේව ජුවාම් තුමාට වසර අට පිරෙත්ම, පෘතුගාලයේ මොන්තෙමෝරෙලිනෝවෝ නගරයට පැමිණි පියතුමෙක් තම ගෙය අත්හැර තමා සමග එන ලෙස ඉල්ලීය. පියතුමා ඔහුද සමග ස්පාඤ්ඤයේ ඔරෝපෙසා නගරයට ගිය විට බෙයිලිෆ් හට බාරදී අතුරුදහන් විය. පසුව දේව ජුවාම්ගේ මව මිය ගිය අතර පියා ප්‍රැන්සිස්කන් නිකායට බැදුණි. බෙයිලිෆ් ජුවාම්ව තම පවුලේ කෙනෙකු ලෙස හදා වඩා ගත් අතර , පාසල් ද යවමින් ඔරෝපෙසා හී කවුන්ට්වරයාගේ සත්ව ගොවිපල බලාගන්නට සැලසීය. පසුව ඔහුව එතුමාගේ ගබඩාගාර ධූරයටද පත්කරන ලදි. එකල ස්පාඤ්ඤයේ පස් වන චාල්ස් රජු ප්‍රංශයට විරුද්ධව යුධ ප්‍රකාශ කර තිබුණි. එවිට හමුදාව බැදුන ඔහු හංගේරියේ සිටි තුර්කීන්ට විරුද්ධව සටන් බිමට ගියේය.

එම යුද්ධයට පසුව උතුරු අප්‍රිකාවට ගොස් ක්‍රිස්තියානීන්ට සහයෝගය දී ප්‍රාණපරිත්‍යාගී වරයකු ලෙස මියයන්නට එතුමා සිතුවේය. එහි දී ස්වාමිපුරුෂයා රෝගාතුර වූ පෘතුගීසි කාන්තාවක් මුණගැසී එම පවුලේ අයට සේවය කළාය. පසුව ඔහු ආගමික පොත්පත් හා පිංතූර විකුණමින් ගම් සහ නගරයන්හී ඇවිදින්නට පටන් ගත්හ.

දිනක් හිස්පයින් යන දරුවකු මුණගැසී , ඔහුව කරේ තබාගෙන යන විට , දැනුන මහන්සියත් විඩාවත් නිසා දරුවා තබා ජලපානය සදහා ගඟට බැස්ස කළ තමාගේ මුහුණ වෙනුවට ඒ දරුවාගේ මුහුණ තුළ ජේසුව දර්ශනය කළේය. එම දරුවාගේ අතේ කුරුසියක් සමග මෙම වචන ලියා තිබෙනු දක්නට ලැබිනි එනම් " දේව ජුවාම් , ඔබගේ ලාංඡනය කුරුසිය වේ. " එම ලාංඡනය දයාවේ ක්‍රියා සහ ශස්ත්‍රීකත්වයේ සලකුණ විය. එදා සිට එතුමාව දේව ජුවාම් ලෙස හැඳින්විනි. ග්‍රැනඩාවට ගිය ඔහු තම සේවාව සදහා ආගමික පොතපත සහ පිංතූර විකිණීම නැවතත් ආරම්භ කළහ. වර්‍ෂ 1537 ජනවාරි මස එහි දේශනාවට පැමිණි චතුර කතිකයකු වූ අවිලිහී ශු. ජුවාම් තුමා හමුවිය. එතුමාගේ දේශනා ඇසූ ජුවාම් හඬන්නටත් , පශ්චත්තාපවන්නටත් පටන් ගත් කළ ඔහු ඔල්මාදකාරයකු යයි සිතා ගම්වැසියෝ ඔහුව සිරකළහ.

මෙය දැනගත් අවිලාහී ශු . ජුවාම් තුමා ස්පාඤ්ඤයේ තිබූ ගුවාඩලූපේ දෙව් මව්ගේ සිද්ධස්ථානයට ගොස් යාච්ඤා කරන ලෙස ඔහුට කීය. එහිදී ඔහුගේ කැදවීම රෝගීන් , මරණාසන්න වුවන් , සාගිනිවුවන් බැලීමත් , ඔවුන්ට වස්ත්‍ර දීමත් බව දර්ශනයකින් තේරුම් ගත්හ. ග්‍රැනඩාවට පැමිණි දේව ජුවාම් තුමා , ඇඳන් 46 ක් සහිත රෝහලක් සාදා නගරවාසීන්ගේ උදව් උපකාර ඇතිව ඔවුන් රැකබලා ගත්හ. ඒ අතර තුර තම සාත්තු සේවා කරගෙන යාම සදහා ශු . දේව ජුවාම් තුමාගේ නිකාය ආරම්භ කළහ. අවු . 12ක අවිවේකී සාත්තු සේවා වල නියැලුණු එතුමා 1550 දී තම පෞද්ගලික යාච්ඤා ගෘහයේදී ස්වර්ගස්ථ වුවාය. වර්‍ෂ 1690 දී ශුද්ධවන්තභාවයට ඔසවනු ලැබ පොත් අලවිකරන්නන් ගේත් , රෝගීන්ගේ හා රෝහල්හී ආරක්‍ෂක මුනිවරයා ලෙස නම් කරන ලදි.

**අසේල දසනායක විසිනි**


මෝසෙස්
78

# ප්‍රහේළිකා අංක 49



## හරහට

1. ''මා නුඹ කුසෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. යනුවෙන් මෙම දිවැසිවරයාව කැඳවීමේදී දෙවියන් වහන්සේ ඔහුට වදාල සේක.

4. පෞද්ගලික ඕනෑකම් ගැන කරදර නොවෙන්නැයි ප්‍රකාශ කරමි. තමුන්ගේ සකල තේජසින් සැරසී සිටි සලමොන් රජු වුවද මානෙල් ............. සේ විරාජමාන නොවී යැයි ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. සමාන.................... ආශ්‍රය කළ යුතු බව පවසමින් ''මැටි මුට්ටිය යකඩ බුජම ළඟ තබන්නේ කුමට ද'' බුජම ඒ මත වැටුණු විට මැටි මුට්ටිය බිඳී යන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සමාරීය ස්ත්‍රීයගෙන් බීමට මේවා ඉල්ලූ සේක.

7. ඔබගේ අසල්වැසියාට ඔහුගේ අවශ්‍යතාවයේදී මෙය ලබාදීම දයාවේ ක්‍රියාවක් බව උපදේශකයා හෙවත් සිරා පවසයි.

8. ''විපත්ති දවස් පැමිණෙන්නට පෙර, ඔබේ යොවුන් වියේදී ඔබේ මැවුම්කාර දෙවියන් වහන්සේ සිහිකරන්න'' යනුවෙන් පවසමින් ධර්මදේශකයා මොවුන් හට අවවාද කරයි.

## පහළට

1. ජොෂුවා සහ ඊශ්‍රායෙල් ජනතාව මෙහි පවුර වටා දින සතක් ගමන් කළ පසු මෙහි පවුර ඇද වැටුනේය.

2. අප බලාපොරොත්තු නොවන පැයකදී මනුෂ්‍යය පුත්‍රයාණෝ වඩින බැවින් තම ස්වාමියා සරණ මංගල්‍යයෙන් පසු කුමන ................ ට නිවසට පැමිණෙදැයි නොදන් නිසා අවදිව සිටින දාසයන් හා සමාන වන්නැයි ක්‍රිස්තු වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචන.

3. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ වර මොවුන් සුව කළ සේක.

5. ඔබට ඊර්ෂ්‍යා කරන අයගෙන් ඔබේ .............. සඟවා ගැන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

> මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ජෙරමියා 1/5 ශු. ලූක් 12/35, 27/ ජොසුවා 6, උපදේශකය හෙවත් සිරාක් 13/2, 29/2, 37/10, ධර්මඋපදේශකයා 11

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**



පසුගියදා කොළඹ සාන්ත ජොසප් විද්‍යාලයේ රංග ශාලාවේ පැවැති 2014 සාහිත්‍ය වසර වෙනුවෙන් සංවිධානය කළ වාද්‍ය අංශයේ 9 - 10 ශ්‍රේණිවල සමස්ත ලංකා ප්‍රථමස්ථානය රත්නපුර පදවියේ ඇඹිලිපිටිය මීසම නියෝජනය කරමින් ඩ්‍රම්ස් වාදනයක් ඉදිරිපත් කළ චමිත් සචින් ෆෝන්සේකා හිමිකර ගත් අතර මොහුව ළ.ක්‍රි.වි. ජාතික සංගීත කණ්ඩායමේ ඩ්‍රම්ස් වාදන ශිල්පියා ලෙසද මෙහිදි තෝරා ගනිති. සචින් ෆෝන්සේකා සිසුවාට ළමා ප්‍රදීපය සුභ පැතුම්.

# ඔබ දන්නවාද?

නිදහසින් පසු ලංකාවේ ප්‍රථම අධ්‍යාපන ඇමතිවරයා කව්ද?
**ඊ.ඒ. නුගවෙල මහතා**

ශ්‍රී ලංකාවේ ප්‍රථම පොලිස් අධිකාරිවරිය කව්ද?
**ප්‍රමිලා දිවාකර**

සිවිල් සේවකයෙකු ලෙස පත්වූ ප්‍රථම ලාංකිකයා කව්ද?
**පොන්නම්බලම් අරුණාචලම්**

ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන්ම පුරාවිද්‍යා ගවේෂණයෙහි යෙදුනු පුද්ගලයා කව්ද? **එච්.සී.පී.බෙල්**

ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා කව්ද?
**ආචාර්ය එන්.එම්. පෙරේරා**

ශ්‍රී ලංකාවේ වන ජීවිතය අළලාග්‍රන්ථයක් නිකුත්කළ විදේශික ගත් කතුවරයා කව්ද? ග්‍රන්ථය කුමක්ද?
**ලෙනාඩ් වුල්ෆ් - බද්දේගම**

**මැක්සිමස් රෝයි පෙරේරා මාමා**

# ලක්දිවට සැපැත්වූ අප ආදර සුදුතුම් පියාණෝ.....





සේයා :-

තිළිණ අලහකෝන්
සාගර ලක්මාල් ද මෙල්